**දකුණු පළාත් සභාව**

**දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය**

**ලංසු සඳහා ආරාධනයයි**

## ආරක්ෂක සේවාව සැපයීම (2025/2026)

දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය හා එයට අනුබද්ධ ආයතන සඳහා 2025.03.15 දින සිට 2026.03.14 දින දක්වා වර්ෂයක කාල සීමාවක් සඳහා පහත සඳහන් කර ඇති ස්ථාන සඳහා ආරක්ෂක සේවාව සැපයීමට සුදුසුකම් ලත් සේවා සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

02. මේ සඳහා අභිලාශයක් දක්වන ලංසුකරුවන්ට අදාල ප්‍රසම්පාදන ලියකියවිලි **2025.01.27 දින සිට 2025.02.06 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව 9.00 සිට ප.ව.3.00** දක්වා කාලය තුළ පහත පරිදි ගාස්තු ගෙවීමෙන් ගාල්ල එස්.එච්.දහනායක මාවතේ පිහිටි දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය.

| ලංසු අංකය | විස්තරය | සේවාව සැපයීම සඳහා අවශ්‍ය නිලධාරීන් සංඛ්‍යාව | ලංසු සුරක්ෂණය (රු.) | ආපසු නොගෙවන ලංසු ගාස්තුව (රු.) |
|---|---|---|---|---|
| **SP/CS/NCB/2025/01** | **දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය, සැලසුම් ලේකම් කාර්යාලය, වක්වැල්ල කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය, ලබුදූව ප්‍රධාන ලේකම් නිල නිවස, ලබුදූව මන්ත්‍රී නේවාසිකාගාරය අසල පිවිසුම, ලබුදූව නිල නිවාස සංකීර්ණයේ ප්‍රධාන පිවිසුම් මාර්ගය, හම්බන්තොට මයුරපුර නිවාඩු නිකේතනය සහ තිස්සමහාරාමය බෝගහපැලැස්ස නිවාඩු නිකේතනය හා පුහුණු මධ්‍යස්ථානය සඳහා ආරක්ෂක සේවාව ලබා ගැනීම.** | **16** | **90,000.00** | **3,500.00** |

03. ලංසු ඉදිරිපත් කරනු ලබන ලංසුකරුවන්ගේ සුදුසුකම් නිර්ණායක පහත පරිදි වේ.

3.1 ආරක්ෂක සේවා සැපයීම සම්බන්ධව අවම වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුය.

3.2 සේවයේ යොදවනු ලබන ආරක්ෂක නිලධාරීන්ගේ අවම වයස අවු.25 විය යුතු අතර උපරිම වයස අවු. 55 නොඉක්මවිය යුතුය. තවද අවම වශයෙන් පෞද්ගලික ආරක්ෂක සේවයෙහි වසර 01ක සේවා පළපුරුද්ද සහිත ආරක්ෂක නිලධාරීන් විය යුතුය.

3.3 ලංසුකරු, ආරක්ෂක සේවාව සැපයීම සම්බන්ධයෙන් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි ආයතනයක් විය යුතු අතර ගිවිසුම් ගත වන කාල සීමාව (2025.03.15 – 2026.03.14 දක්වා) වලංගු ලියාපදිංචියක් තිබිය යුතුය.

3.4 දකුණු පළාත තුළ ආයතනය සතුව ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සහිත කාර්යාලයක් පිහිටා තිබීම **හෝ** ආරක්ෂක නිලධාරීන්ගේ අධීක්ෂණ කටයුතු හා සම්බන්ධීකරණ කටයුතු සඳහා ප්‍රාදේශීය කළමනාකරුවකු සේවය කළ යුතුය.

04. ලංසුව සමග ඉදිරිපත් කරනු ලබන ලංසු සුරක්ෂණය ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි ඕනෑම වාණිජ බැංකුවකින්, දකුණු පළාත් ප්‍රධාන ලේකම් නමට ලබාගත් **2025.05.23 දින දක්වා** වලංගු බැංකු ඇපකරයක් හෝ ප්‍රධාන ලේකම් කාර්යාලයේ ගිණුම් අංශය වෙත මුදල් ගෙවීමෙන් අනතුරුව ලබාදෙන මුදල් කුවිතාන්සියේ මුල් පිටපත ප්‍රසම්පාදන පත්‍රිකාව සමග ඉදිරිපත් කළ යුතුය. චෙක්පත් හෝ බැංකු අණකර ලෙස ඉදිරිපත් කරන ලංසු සුරක්ෂණ ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. මෙම ප්‍රසම්පාදනයට අදාළව ඉදිරිපත් කරනු ලබන ලංසු, පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතු අතර, ලංසු වල මුල් පිටපත හා අනු පිටපත වෙන වෙන ම කවරවල බහා මුද්‍රා තබා එම කවර දෙක එක් කවරයක බහා එම කවරය ද මුද්‍රා තබා ඉදිරිපත් කළ යුතුය.

06. මුද්‍රා තබන ලද ප්‍රසම්පාදන පත්‍රිකා **2025.02.07 වන දින ප.ව. 2.30** ට **පෙර** ලැබෙනසේ ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්.දහනායක මාවත, ගාල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ අතින් ගෙනවිත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ සැපයුම් අංශයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැක. මිල ගණන් ඉදිරිපත් කරනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවර **ලංසු අංකය හා "ආරක්ෂක සේවාව සැපයීම සඳහා මිල ගණන්"** යනුවෙන් සඳහන් කළ යුතුය.

07. ලංසු විවෘත කිරීම **2025.02.07 දින** ලංසු භාර ගැනීම අවසන් වූ වහාම **ප.ව. 2.30** ට ප්‍රධාන ලේකම් කාර්යාලයේ දී සිදු කරන අතර එම අවස්ථාවට ලංසුකරුට හෝ ලංසුකරුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැකිය. ප්‍රමාද වී ඉදිරිපත් කරන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය බව කාරුණිකව සලකන්න.

සැලකිය යුතුයි : ප්‍රසම්පාදන දැන්වීම දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ www.cs.sp.gov.lk වෙබ් අඩවියෙහි දිස්වනු ඇත.

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය,
එස්.එච්.දහනායක මාවත,
ගාල්ල.

දුරකතන අංකය: 091 – 4944016/ 091-4946368
ඊ මේල් : procurementplan1@gmail.com

දිනය : 2025.01.24